# සූත්‍රදේශනා ආශ්‍රයෙන් සිත පිළිබඳ මූලික විමසුමක්

- ආධුනික කථිකාචාර්ය
බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි

මනස යනු කුමක්ද? හෝ මනස කවරාකාරද? කියා හෝ විමසිය යුතුය. එසේ කළ යුත්තේ චිත්ත, මනෝ, විඤ්ඤාණ යනුවෙන් ධර්ම තුනක් පෙළ දහමෙහි හමුවන බැවිනි. ඒවා අන්‍යොන්‍යද? අනන්‍යද? ක්‍රියාකාරීත්වය කවරාකාර ද යනු විමසීම මෙහි අරමුණයි.


චිත්ත, මන, විඤ්ඤාණ යන ධම් තුන ම එකවර යෙදෙන තැනක් ලෙස අස්සුතවන්තු සූත්‍රය දැක්විය හැකිය. එහි මෙසේ දැක්වෙයි.

"මහණෙනි, චිත්ත-මන-විඤ්ඤාණ යනුවෙන් පවසන යමක් වේ නම් එය දිවා රෑ දෙකෙහි එකක් උපදියි. අනෙකක් නිරුද්ධ වෙයි."[1]

ඉන් කියැවෙන්නේ සිත-මනස-විඤ්ඤාණය මොහොතක් පාසා වෙනස්වීමේ ස්වභාවයෙන් (අනිත්‍යතාවෙන්) යුක්ත බවයි. එසේම එමගින් ඉහත ධර්ම තුනෙහි අන්‍යොන්‍යතාවක් ද ප්‍රකට වෙයි. එනම් අනිත්‍යතාවයි. මෙහි අටුවාව අනුව චිත්ත, මන, විඤ්ඤාණ යනු 'මනායතනයෙහි' ම ක්‍රියාකාරී අවස්ථා තුනෙකි. "චිත්ත, මන, විඤ්ඤාණ" යන සියලු ව්‍යවහාර මනායතනය උදෙසා ම භාවිත කෙරේ. විචිත්‍රවත් කිරීමට මුල්වන බැවින්, (චිත්තවත්ථුතාය) අවශ්‍යවන බැවින්, යෙදුණු තැන විචිත්‍රවත් වන බැවින් චිත්ත නම් වෙයි. මෙනෙහි කිරීම් අර්ථයෙන් 'මන'ය. දැනගැනීම යන අර්ථයෙන් විඤ්ඤාණ යැයි කියනු ලැබේ.[2]



යම් අරමුණක් විවිධාංගීකරණය කොට වෙනසකට භාජන කරන මනෝ ලක්ෂණය 'චිත්ත' ලෙසත් ආරම්මණයන් විචිත්‍රකරණයට යොදවන, මෙනෙහි කරවන යෝජකත්වය හා ආවර්ජනා ප්‍රතිබද්ධකත්වය මන ලෙසත් සංජානන-විජානන සහිත විශ්ලේෂණාත්මකතාව විඤ්ඤාණ ලෙසත් හැඳින්විය හැකිය. පුද්ගල මානසික ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ විශේෂ හා ආවශ්‍යක ධර්ම කිහිපයක් ලෙස ප්‍රජානනය-විජානනය-සංවේදනය-සංජානනය දැක්විය හැකිය. ප්‍රජානන යනු ප්‍රඥාවයි. පරිඤ්ඤා හෙවත් පිරිසිඳ දැනීම මගින් ප්‍රජානනය (පඤ්ඤා) හටගනී. විජානනය විඤ්ඤාණ නම් වෙයි. සැප-දුක ලෙස යමක් රඳවාගන්නාගතිය, මතකය, ශේෂය විඤ්ඤාණ නම් වෙයි. එබඳු සැප-දුක වේදනා විඳින බව 'වේදනා' නම් වෙයි. යමක් වර්ණ-හැඩ වශයෙන් හඳුනාගැනීම සංඥා නම් වෙයි.[3]




බාහිර ආයතනයක් පිළිබඳ ස්පර්ශය අභ්‍යන්තර ආයතන හරහා ලැබෙයි. එවිට ඒ පිළිබඳ දැනුමක් හටගනියි. වින්දනයට, හඳුනාගැනීමට, සිතිවිලි ඉපදවීමට ආරම්භයක් සිදුවෙයි. එය මනෝ නම් වෙයි. එම සිතිවිලි ඉපදවීමේ ක්‍රියාවලිය තුළ විවිධාකාර සිත් උපදියි. ඊට විඤ්ඤාණ ද දායක වෙයි. අරමුණු ග්‍රහණයට ද විඤ්ඤාණය අවශ්‍ය වෙයි. ගත් අරමුණ කාර්යයෙහි යෙදවීම 'චිත්ත' ය. එබඳු සිත්වල එකතුව විඤ්ඤාණය ය. සියලු සිතිවිලිවල ක්‍රියාකාරී ගතිය ඇතිවීම 'මනෝ' නම් වෙයි. එසේ ඇති වූ ක්‍රියාකාරීත්වය නිසා උපදින්නේ සිත් ය. සිත් එකතුව

විඤ්ඤාණ නම් වෙයි. මනස සහ විඤ්ඤාණය එකතු වූ කළ ද සිත් උපදී. එහිදී මනස යන්නෙන් අදහස් කළේ වේදනා-සංඥා-සංඛාර යි. සිත පිළිබඳ ධම්ම සංගණීටීකාවෙහි මෙසේ සඳහන් වෙයි.

''සිතීම් අර්ථයෙන් සිත නම් වේ. විචිත්‍ර වේ යන අර්ථයෙන් ද 'සිත' නම් වෙයි. කුමක් නිසා ද යත් අරමුණු ගන්නා ද්වාරය, අරමුණ, කරන කටයුත්ත සේ ම අතීතාදී කාලභේද වශයෙන් ද චිත්තය විවිධාංගී කෘත (විචිත්‍ර) නිසා චිත්ත නම් වෙයි. ලෝකයෙහි සිත තරම් විචිත්‍ර යමක් නොමැත. ලොව ඇතිතාක් සියල්ල සිත විසින් ම කරයි. මෙසේ සෑම තැනෙකදී ම, අවස්ථාවකදීම සිත විචිත්‍රය. එබැවින්, චිත්ත නම් වෙයි.[4]''

ඒ අනුව 'චිත්ත' යනු චින්තන ක්‍රියාවලියෙහි විචිත්‍රතාව දැක්වීම පිණිස මනායතනයට දෙන ලද නමකි. මන යනු ද චින්තන ක්‍රියාවලියෙහි 'කාරකත්‍වය'-මනසිකාරත්‍වය දැක්වීමට සිතට ම දෙන ලද නමකි. 'මන' හඳුන්වන මහානිද්දේසය, ''මන යනු සිතයි. මෙනෙහි කිරීම් සහිත බවයි, හදයයි. පිරිසිදු ඉන්ද්‍රියයි. මනසයි. මනායතනයයි, මනින්ද්‍රියයි, විඤ්ඤාණයයි. විඤ්ඤාණස්කන්ධයයි. මනෝ විඤ්ඤාණ ධාතුව යි.''[5] යනුවෙන් දක්වයි. එහි මන යන්නට සමානවාචී පද ලෙස, චිත්තං, මනං, මානසං, හදයං, පණ්ඩරං, මනෝ, මනායතනං, මනින්ද්‍රියං, විඤ්ඤාණං. විඤ්ඤාණක්ඛන්ධෝ, මනෝවිඤ්ඤාණධාතු දක්වයි. නිද්දේස අටුවාව උක්ත කරුණු වැඩිදුරටත් මෙසේ විස්තර කරයි.

1. චිත්තං - චිත්ත විචිත්තතාය විසිතුරු බව නිසා (චිත්ත නම් වේ).[6]
2. මනො - ආරම්මණං මිනමානං ජානාතීති මනො.[7] අරමුණු මනින අයුරු දන්නේ 'මන' යි.
3. මානසං - සම්පයුත්තක ධම්මා මානසො.[8] මෙනෙහි කිරීමේ ලක්‍ෂණ සහිත බව මානස යි.



4. හදයං - හදයන්ති චිත්තං.[9] සිතට නමකි. (මෙය හදයංවා තෙ ඵාලෙස්සාමි යන තැන්වල උරස්ථීය සඳහාත්, හදයා හදයං මඤ්ඤේ යන තැන්හි සිතටත්, වක්කං හදයං....යනාදියෙහි හෘදය වස්තුවටත්, භාවිතය. මෙහිදී අභ්‍යන්තර අර්ථයෙන් 'සිත' හැඳින්වීමට 'හදයං' යනු භාවිත කර ඇත.)
5. පණ්ඩරං - භවංගං සන්ධායෙතං වුත්තං පරිසුද්ධට්ඨෙන. භවංග සිත පිරිසිදු නිසා පණ්ඩර නම් වෙයි. පණ්ඩර යනු සුදු/පිරිසිදු බවයි.[10]
6. මනෝ, මනායතනං - මෙහිදී මනස ම අදහස් කරයි. වාසස්ථානය, ස්වභාවය, උත්පත්තිය දෙන ස්ථානය වැනි අර්ථ සහිතව ආයතන යන නම යෙදී ඇත. ස්පර්ශ ආදී සිතිවිලි හටගන්නා තැන යන අර්ථය ඉපිදවීමට ද 'මනායතන' යනු යෙදේ.[11]
7. මනින්ද්‍රියං - මෙනෙහි කිරීමේදී ප්‍රමුඛත්වය ගනී යන අර්ථයෙන් ද මනින්ද්‍රිය නම් වෙයි.[12]
8. විඤ්ඤාණං - 'විජානාතීති විඤ්ඤාණං'දැනගනී යන අර්ථයෙන් විඤ්ඤාණ නම් වෙයි. (කිඤ්ච විජානාති, සුඛන්ති'පි විජානාති, දුක්ඛන්ති'පි, විජානාති,..... සංවේදන, සංජානන දැනගැනීම විඤ්ඤාණ නම් වෙයි.)[13]
9. විඤ්ඤාණක්ඛන්ධො - විඤ්ඤාණයෙහි ම එක්තැන් වූ ගතිය විඤ්ඤාණක්ඛන්ධ නම් වෙයි. (මහා උදකක්ඛන්ධොත්වේව සංඛං ගච්ඡතී'ති එත්ථ හි රාසට්ඨෙන ඛන්ධො වුත්තෝ) ගුණ ප්‍රකාශ කිරීම් වශයෙන් ද 'ඛන්ධ' නම් වෙයි. (සීලක්ඛන්ධො, සමාධික්ඛන්ධෝ ති ආදීසු ගුණට්ඨෙන) පැනවීම්/ප්‍රකාශ කිරීම් අර්ථයෙන් ද 'ඛන්ධ' යයි භාවිත කෙරෙයි. (අද්දසා ඛො භගවා මහන්තං දරුක්ඛන්ධංති එත්ථ පණ්ණත්තිමත්තට්ඨෙන)[14]

මෙම විවිධාකර පද පිළිබඳව නිද්දේස අටුවාව දක්වන්නේ මෙබඳු අදහසකි.

''මෙම පදයන්ගෙන් එකක් ම වූ සිත, මැනීම සිදුකෙරේ යන අරුතින් 'මනෝ' යැයි ද දනී යන අරුතින් 'විඤ්ඤාණ යැයි ද ස්වභාවය හා අනාත්මතා ප්‍රකට කිරීම් වශයෙන් 'ධාතු' යැයි ද නම් තුනකින් දක්වා ඇත.[15] ඒ අනුව 'මන, විඤ්ඤාණ, ධාතු' යන නම් තුන ම 'චිත්ත' විශ්ලේෂණය කිරීමෙන් ඉදිරිපත් කළ පර්යාය නම් බව සිතිය හැකිය. සිතෙහි ස්වභාවය කුමක්දැයි දක්වන නිද්දෙස අට්ඨකථාව, ඒ සඳහා විග්‍රහ අටක් ඉදිරිපත් කරයි.[16]

1. සහගතෝ - අවිජහිතො : අත්නොහරී
2. සහජාතෝ - සද්ධිං නිග්ගතො : අරමුණ සමගම සිතිවිලි හා එක්ව ගමන් කරයි.
3. සංසට්ඨො - සංසග්ගෝ හුත්වා ඨිතො : අරමුණ හා මිශ්‍රව සිටී.
4. සම්පයුත්තෝ - සමං පකාරෙහි යුත්තෝ : අරමුණ හා සමව පවතින අයුරින් පවතී.
5. එකුප්පාදෝ - එකතො උප්පන්නෝ : අරමුණ අත්නොහැර එකටම උපදී.
6. එකනිරොධො - එකතො නිරොධො : අරමුණ සමගම නිරුද්ධ වේ.
7. එකවත්ථුකො - හදයවත්ථු වසෙන එකවත්ථුකො : හදයවත්ථු ආශ්‍රය කොට පවතින නිසා එකවත්ථුකය.
8. එකාරම්මණො - රූපාදිවසෙන එකාරම්මණො : රූපාදී අරමුණම ගන්නා බැවින් ඒකාරම්මණය.



මෙහිදී සිත හා සිතිවිලි අතර පවතින අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වය ඉදිරිපත් කරයි. 'මනෝ' යන්න හඳුන්වන ධම්මපද අටුවාව මන යනු කාමාවචර කුසලසිත් ආදී වශයෙන් ප්‍රභේද ඇති, කාම-රූප-අරූප-ලෝකෝත්තර යන සිව් භූමික සිත් බව දක්වයි.[17] ඒ අනුව 89/121 ක් වූ සිත් සියල්ලම 'මනෝ' යන්නෙන් අදහස් කරන ලදි. ඒ අනුව 'මන' යන්නෙන් එහිදී 'සිත' ම අදහස් කර ඇත. සිතෙහි උපත පිළිබඳ 'ධම්මසංගණී' ප්‍රකරණය මෙසේ දක්වයි.


''කතමේ ධම්මා අකුසලා? යස්මිං සමයේ අකුසලං චිත්තං උප්පන්නං හොති සෝමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං රූපාරම්මණං වා..... ධම්මාරම්මණං වා යංපනාරබ්බ තස්මිං සමයෙ ඵස්සො හොති...චිත්තං හොති... මනින්ද්‍රියං හොති... යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඉමේ ධම්මා අකුසලා.[18]

මෙහි චිත්ත හා මන සමාන විග්‍රහ පද සහිතව ඉදිරිපත් කර ඇත.[19] ඒ විග්‍රහ අනුව ගම්‍ය වන්නේ 'මන' චිත්ත විඤ්ඤාණ යනු ඉන්ද්‍රිය, ආරම්මණ ක්‍රියාවලියෙහි සංවිධානාත්මක එකතුව බවයි. ක්‍රියාකාරී ස්වභාව තුනක් දැක්වීමට වචන තුනක් භාවිත කළ බව පෙනේ.


චින්තනය දක්වනවිට චිත්ත-චෛතසික යන්න නිතර එකට යෙදේ. අභිධර්මයෙහි එය චිත්ත-කාය ලෙස ද භාවිත කර ඇත. එහි චිත්ත යනු සිත, මනස, විඤ්ඤාණය යි. කාය යනු වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධත්‍රය යි.[20]

ඒ අනුව කායපස්සද්ධි යනු 'වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධත්‍රයෙහි සැහැල්ලුබවයි.' චිත්තපස්සද්ධි යනු විඤ්ඤාණස්කන්ධයෙහි සැහැල්ලු බවයි. මෙහි 'කාය' යන්න සළායතනවල 'ධම්ම' යන්නට සමාන වෙයි. එම ධම්ම, කාය සමග මනෝ, චිත්ත, විඤ්ඤාණ එකතු වීමෙන් 'මනෝ විඤ්ඤාණ' උපදී. සෑම ඉන්ද්‍රියයක් සමග ම විඤ්ඤාණ යෙදේ. එවිට උපදින අභිනව විඤ්ඤාණ ඉන්ද්‍රියේ නමින් හැඳින්වෙයි.

එසේ සෑම ඉන්ද්‍රියාරම්මණයක් සමගම විඤ්ඤාණය පවතී. ඉන්ද්‍රියාරම්මණ ක්‍රියාකාරීත්වයක් පවතින බව 'චිත්ත' යන පදයෙන් දැක්වෙන අතර, එම ක්‍රියාකාරීත්වය 'මන' යනුවෙන් දැක්වෙයි. 'මන' යනු මැනීමයි. මෙනෙහි කිරීමයි.




මෙහි ඇත්තේ පඤ්චස්කන්ධය ම ය. පංචස්කන්ධයෙහි






යන ස්කන්ධයන්හි අන්‍යෝන්‍ය සංස්කරණය සිත් උපතට හේතුව යි. එසේ සිත් උපන් කල්හි එම ස්කන්ධයෝ පංච උපාදානස්කන්ධයෝ, නම් වෙති. ඉන්ද්‍රියට හා ආයතනයට අනුව විඤ්ඤාණ යන නම යෙදී ඇති අතර චිත්ත යන නම භාවිත වන්නේ භූමි අනුවයි. එනම්, චක්ඛු ආදී ආයතන වළ නමින් විඤ්ඤාණය හඳුන්වන අතර චිත්ත යන වචනය භාවිත කරන්නේ කාමාවචර, රූපාවචර ආදී භූමීන්ට අදාළ සිත් වර්ග කිරීමට යි. කුමන ඉන්ද්‍රියකින් හටගත්ත ද චිත්ත-චිත්තම ය. එහෙත් විඤ්ඤාණ වර්ග කර ඇත්තේ ද්වාරය අනුව ය. මෙයින් ගම්‍ය වන්නේ විඤ්ඤාණ යන ව්‍යවහාරයෙන් සරල හා බාහිර ක්‍රියාදාමයක් විග්‍රහ කරන අතර 'චිත්ත' යන ව්‍යවහාරය මගින් අභ්‍යන්තර ගැඹුරු ධාර්මික විවරණයක් සපයන බවයි. මන යනු උක්ත ක්‍රියාවලින්හි පවතින ලක්ෂණයකි. එනම්, චිත්ත-විඤ්ඤාණ යනුවෙන් හඳුන්වන සත්ත්ව චින්තනයෙහි පවතින මෙනෙහි කිරීමේ, මැනීමේ ගතිය මනස යි. එය සිතිවිලි හා එක්වීම චිත්ත හා විඤ්ඤාණ නම් වෙයි. මන-සිතිවිලි එක් වූ තැන මනස පිළිබඳ විඤ්ඤාණය උපදී. ඇස ආදී ඉන්ද්‍රියයක් බාහිර අරමුණක් හා එක්වීමෙන් ඒ ඒ දෙරටුවේ නමින් විඤ්ඤාණ උපදින අයුරු ධම්මයෙහි දක්වනු පෙනේ. ඒ අනුව ප්‍රකට වන්නේ චිත්ත-මන-විඤ්ඤාණ යනු සමානවාචී (පර්යාය) පද බවයි.

උපදින ද්වාර අනුව විඤ්ඤාණ හයක් වුව ද සිත් වර්ග කිරීමේදී එය ඉතා පුළුල් වෙයි. නිදසුනක් ලෙස චාතුර්භූමික සිත් 89/121 දැක්විය හැකිය. එසේම ඊට මදක් වෙනස් විග්‍රහයක් පටිසම්භිදමග්ගයෙහි 'ආනාපානසති කථා'වෙහි හමුවෙයි. එහි ආනාපානසතිය වැඩීම මගින් උපදින ඤාණ 200ක් පෙන්වාදෙයි.[21]

විවිධාකාර සිත් උපතට හේතුව සිතෙහි ක්‍රියාකාරී ස්වභාවයි. ධම්මපදඅටුවාව අනුව සිතිවිලි ධර්ම හා එක්ව මූලිකත්වය ගෙන ක්‍රියා කරන්නේ සිතයි. සිතිවිලි සමග එකවත්ථුක- එකාරම්මණ වන සිත මූලිකයා වන්නේ කෙසේද? එසේ දක්වන්නේ ඉපදීමේ ස්වභාවය අනුවයි. මීට නිදසුනක් එහි ම දැක්වෙයි.

'යම් සේ, සොරුන් පිරිසක් එක්ව සොරකම් කරන කල්හි, එම සොරුන්ට මග පෙන්වන, පහසුකම් සපයන පුද්ගලයා මූලිකයා ලෙස හැඳින්වෙයි ද, එසේ ම මනස ද සිතිවිලිවලට පූර්වාංගම ය. මනස නොමැතිව සිතිවිලි නූපදින අතර එකම සිතිවිල්ලක් හෝ නොමැතිව වුව ද මනස උපදී, පවතී. එම නායකත්වය, මූලිකත්වය නිසා මනස ශ්‍රේෂ්ඨබවත් ලීයෙන් කළ භාණ්ඩ දාරුමය වන්නා සේ මනසින් උපන් සිතිවිලි 'මනෝමය' ලෙස ද දක්වා ඇත.[22] සිතිවිලි හසුරුවන්නේ මනස විසිනි. එහෙත් විවිධ සිත් උපතට හේතුව මනස සමග යෙදෙන සිතිවිලි නානත්වය යි. පුරුෂයා යන ව්‍යවහාරය හටගන්නේ ධාතු හයක් එකතු වූ කල්හි ය. එනම්, පඨවි-ආපෝ-තේජෝ-වායෝ-ආකාස විඤ්ඤාණ යන හයයි.[23] එතුළ ඇත්තේ ද පංචස්කන්ධයමය.

රූප- පඨවි, ආපෝ, තේජෝ, වායො, ආකාස (පරිච්ඡේද රූප)

වේදනා
සඤ්ඤා
සංඛාර
විඤ්ඤාණ

විඤ්ඤාණ (නාම) ස්කන්ධය

එනම්, නාමරූප යි. විඤ්ඤාණය හා නාමරූප අන්‍යොන්‍ය ප්‍රතිබද්ධ වේ. නාමරූපයන්හි පහළ වීමට විඤ්ඤාණයේ පහසුකම් සපයන්නා වේ. නාමරූපයන්හි සහය පළ වේ.[24] එය සමාන කර ඇත්තේ අන්‍යොන්‍ය ආධාර මත සිටුවා තබා ඇති බට මිටි දෙකකට ය. එකක් මත අනෙක පෝෂණය වීම ඉන් අදහස් කරයි. මීට සමගාමී අදහසක් ඉදිරිපත් කරන මජ්ඣිම නිකායේ මහාවේදල්ල සූත්‍රය, වේදනා සඤ්ඤා විඤ්ඤාණ එකිනෙකින් වෙන් කළ නොහැකි, වෙන්කර විවිධව විස්තර කළ නොහැකි ධර්ම සේ දක්වයි.[25]

බාහිර ආරම්මණයන් ඉදිරියේ මනස සැරිසරන අයුරු ධාතුවිභංග සූත්‍රයෙහි මනාව විග්‍රහ කෙරෙයි. ඊට අනුව ඇස නමැති ඉන්ද්‍රියෙන් රූප දැක සොම්නස් සහගත රූප සොයා




යාම, දොම්නස් සහගත රූප සොයා යාම, මැදහත් සහගත සිතින් රූප සොයා යාම ලෙස මනසින් කරන සැරිසැරීම් තුනකි. මෙසේ ඉන්ද්‍රිය හයට උපවිචාර 18 කි.[26]

1. චක්ඛු + රූප ⟶ I. සෝමනස්සඨානීයං රූපං උපවිචරති
   II. දෙමනස්සඨානීයං රූපං උපවිචරති
   III. උපෙක්ඛාඨානීයං රූපං උපවිචරති
2. සොත + සද්ද ⟶ I. සොමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා
3. ඝාන + ගන්ධ ⟶ I. සොමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා
4. ජිව්හා + රස ⟶ I. සොමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා
5. කාය + පොට්ඨබ්බ ⟶ I. සොමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා
6. මාන + ධම්ම ⟶ I. සොමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා

අරමුණ කෙරෙහි මනස දක්වන වේදනා නම් වූ පළමු ප්‍රතිචාරය මෙහි විස්තෘත ය. මීට වඩා දීඝී මානසික ක්‍රියාවලියක් මධුපිණ්ඩික සූත්‍රයෙහි හමුවෙයි. ඉන්ද්‍රියාරම්මණ ක්‍රියාකාරීත්වය විශ්ලේෂණාත්මකව විග්‍රහකරන අයුරු ඉන් ප්‍රකට වෙයි.

"ඇවැත්නි, ඇසත්, රූපත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. එම තුනෙහි එකතුව ඵස්ස නම් වෙයි. එසේ ස්පර්ශ වූ කල්හි වින්දනය උපදී. විඳින ලද දේ හඳුනා ගනී. හැඳිනූ දෙය විතර්ක කරයි. (මෙහිදී සක්ලේශී අයෙක් නම් කාම-ව්‍යාපාද-විහිංසා විතර්කයෙන් විතර්ක කරයි) විතර්කිත දේ පිළිබඳව රාගය, ද්වේෂය, මෝහය වැනි බොහෝ ප්‍රපඤ්ච උපදවයි. එසේ ප්‍රපඤ්ච උපදවමින් ඇසින් දුටු, දකින, දැකිය හැකි රූප පිළිබඳ සිතින් වාසය කරයි.[27] චිත්ත නියාමය හා මානසික ක්‍රියාකාරීත්වය පිළිබඳ ඉතා වැදගත් ධර්මතාවක් මෙමගින් ප්‍රකට වෙයි.




මෙහි 'වේදනා' යන අවස්ථාව තෙක් ඉන්ද්‍රිය ක්‍රියාවලිය කර්තෘ විරහිතව දක්වා ඇත. මන්ද යත් එය චිත්ත නියාමය මත සෙඛ-අසෙඛ, නෙවසෙඛනාසෙඛ යන සියලු පුද්ගලයන් තුළ සිදුවන ක්‍රියාවලියක් බැවිනි. එය නැවැත්විය නොහැකිය. එහෙත් 'යං වෙදෙති තං සඤ්ජානාති' යන අවස්ථාවේ සිට ඉන්ද්‍රිය ක්‍රියාවලිය සත්ත්ව චින්තනයට භාර කර ඇත. එම නිසා වර්තමාන කාලික කර්තෘකාරක ක්‍රියාවක් ලෙස වෙදෙති-සඤ්ජානාති-විතක්කෙති, වශයෙන් දක්වා ඇතැයි සිතිය හැකිය. වේදනාවෙන් පසු පුද්ගලයා ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය රාග-දෙවෂ-මෝහාදියෙන් තෙතමනය කරමින් ඉදිරියට පවත්වාගෙන යයි.

ඕනෑම අයෙකුගේ සිත ඇරඹුමේදී පිරිසිදු ය. මධුපිණ්ඩික සූත්‍රයෙන් ඒ බව ප්‍රකට වෙයි. ලෝකය තුළ පවතින සාමාන්‍ය ක්‍රියාදමයක් ලෙස වේදනාව දක්වා වූ කොටස දක්වා ඇත්තේ එබැවිනි. පිරිසිදු, පැහැසර සිත ආගන්තුක උපක්ලේශයන්ගෙන් කිලිටි වන බව බුදුරදුන් වදරා ඇත.[28]

මෙහිදී පහස්සර සිත යැයි දක්වන්නේ භවංග සිතයි. එය ජවන සිත්වලදී තණ්හා, දිට්ඨි, මාන යන ක්ලේශයකින් කිලිටි වෙයි.[29] උපාදන කිරීම පෘථජ්ජන ස්වභාවය බැවින් එසේ වෙයි. එබැවින් පෘථජ්ජනයා තුළ චිත්ත භාවනාව නොමැති බවත් ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා චිත්ත භාවනාව හෙවත් 'ජවන ක්ෂණයෙහි කෙලෙස් නූපදවන ප්‍රතිපදව ඇත්තෙකු බව වදරා ඇත.

චිත්ත වීථි අධ්‍යයනයෙන් මෙය මනාව අධ්‍යයනය කළ හැකි වෙයි. මධුපිණ්ඩික සූත්‍රයෙහි ඵස්ස තෙක් දැක්වූ කොටස



චිත්තක්ෂණ 17ක් ඇති චිත්ත වීථියක 8 වන චිත්තක්ෂණය වන වොට්ඨපනය තෙක් අදළ බව සිතිය හැකිය. සැප, දුක, වශයෙන් වින්දනයට සිතක් අවශ්‍ය වෙයි. එම සිත ජවන සිතකි. චිත්ත වීථියක් විග්‍රහ කර බැලූ කළ මෙය වඩාත් ප්‍රකට වනු ඇත. චිත්ත වීථියක් යනු සිතක ගමන් මගයි. සිත් උපදින්නේ නාම-රූප විෂය කරගෙනයි. ඒ අනුව පංචද්වාරික හා මනෝද්වාරික වීථි වශයෙන් වීථි වර්ග දෙකකි. රූපයක ආයුකාලය චිත්තක්ෂණ 17ක් නිසා චිත්ත වීථියක ක්ෂණ 17ක් යෙදී ඇත. චිත්තක්ෂණ 17ක් නොමැති චිත්ත වීථි ද ඇත. ඒ මනෝද්වාරික චිත්ත වීථිවලය.

පංචද්වාරික චිත්තවීථි - 75 කි.

මනෝ ද්වාරික චිත්තවීථි - 9+72+ (9×2×2×2)+80+7+1=169කි

සියලු චිත්ත වීථි ගණන - (75+169)244කි.[30]

පංචද්වාරික චිත්ත වීථිවල ප්‍රභේද 04 කි. ඒ අනුව

| | | | |
|---|---|---|---|
| 1. අතිමහන්තාරම්මණ වීථි | - | 1 | 15×5 = 75 |
| 2. මහන්තාරම්මණ වීථි | - | 2 | |
| 3. පරිත්තාරම්මණ වීථි | - | 6 | |
| 4. අතිපරිත්තාරම්මණ වීථි | - | 6 | |

චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය යන ඉන්ද්‍රිය අනුව (15×5 = 75) වීථි 75කි.

මනෝද්වාරික වීථිවල ප්‍රභේද 05 කි. ඒ

| | | | |
|---|---|---|---|
| 1. කාම ජවන වීථි | - | 9 | 169 |
| 2. අර්පණා ධ්‍යාන වීථි | - | 72 | |
| 3. මාර්ග-ඵල වීථි | - | 80 | |
| 4. අභිඥා වීථි | - | 7 | |
| 5. නිරෝධ සමාපත්ති වීථි | - | 1 | |

වශයෙනි.[31] චිත්ත වීථිවල ක්‍රියාකාරීත්වය අනුව පුද්ගලයාගේ කර්ම ශක්තිය සකස් වෙයි. බුදුදහමේ සඳහන් විවිධාකාර

පුද්ගලයන්ගේ උපතට හා වර්ගීකරණයට බලපා ඇත්තේ ද සිතෙහි ක්‍රියාකාරීත්වයයි.

සිත සංවර කිරීමට අපහසු, චලනය වන වහා වෙනස්වන සුලු එකකි. කය වසර ගණනක් පවතිනු පෙනුනද මනස, සිත, විඤ්ඤාණ මෙහොතක් පාසා වෙනස් වෙයි. ඉන්ද්‍රිය හා ආරම්මණ ඇති කල්හි උපදින චිත්ත, මන, විඤ්ඤාණ එම අරමුණු නැතිවූ සැණින් නැතිව යයි. එහෙත් නැවත භවංගව පැවතී අරමුණක් ලද සැණින් ක්‍රියාකාරී වෙයි. ජීවිතේන්ද්‍රිය චෛතසිකය නිසා ජනක කර්මයෙන් උපන් සිත් පරපුර විනාශ නොවී එකදිගට සන්තතියක් ලෙස පවතියි. සිතිවිලි සමග එක්ව සිත් නිපදවීමත්, එම සිත් අනුව භවය සකස්කර ගැනීමත්, එම කර්ම භවය අනුව උත්පත්ති භවය සකසාගෙන ජාති හෙවත් හටගැනීමත් සිතෙහි කාර්යයයි. එසේ හටගන්නා විට නාම-රූප-වශයෙන් අප එය හඳුන්වයි. නාම රූප ඇති කල්හි නැවත සිත් සකස්වීම ඇරඹෙයි. එය ආයතන නමින් හඳුන්වයි. සිත් සකස්වීම ඇරඹීමත් සමග ඉන්ද්‍රිය-ආරම්මණ-විඤ්ඤාණ සංගති (එකතුවීම) සිදු වෙයි. එය ම නැවත නැවතත් සිත් ඉපදීමට මුල පුරයි. මනෝ ක්‍රියාකාරීත්වයේ යථාරූපීතාව මෙය වෙයි.

## ආන්තික සටහන්

1. සංයුත්ත නිකාය 2.1.7.1. අස්සුතවන්තු සූත්‍රය.
   යඤ්ච ඛො භික්ඛවේ වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤණං ඉතිපි තං රත්තියා ච දිවසස්සට ච අඤ්ඤදෙව උප්පජ්ජති. අඤ්ඤං නිරුජ්ඣති.
2. සංයුත්ත නිකාය අටුවාව 2.1.7.1. අස්සුතවන්තු සූත්‍ර අට්ඨකථා.
   චිත්තන්ති ආදි සබ්බං මනායතනස්සේව නාමං. තඤ්හි චිත්තවත්‍ථුතාය චිත්තගොචරතාය සම්පයුත්තධම්මගොචරතාය ච චිත්තං. මනනට්ඨෙන මනෝ. විජානනට්ඨෙන විඤ්ඤණන්ති වුච්චති.
3. මජ්ඣිම නිකාය1.5.3. මහාවේදල්ල සූත්‍රය.
4. චින්තනට්ඨෙන චිත්තං. චිත්තතාය වා චිත්තං...... මොහ විච්ඡේදනී ටීකා, ධම්ම සංගණී මාතිකා ඛණ්ඩය, මහන්තර දුක කාණ්ඩ වණ්ණනාව.
5. මහානිද්දෙස පාලි, කාමසුත්ත නිද්දෙස.
6. මහානිද්දෙස අ., කාමසුත්ත නිද්දෙස වණ්නනා.



7. එම
8. එම
9. එම
10. එම
11. එම
12. එම
13. එම
14. එම
15. එම
    ඉමස්මිඤ්හි පදෙ එකමෙවචිත්තං මනනට්ඨෙන මනො විජානනට්ඨෙන විඤ්ඤණං සභාවට්ඨෙන නිස්සත්තට්ඨෙන වා ධාතුති තීහි නාමෙහි වුත්තං.
16. එම
17. ධම්ම පද අටුවාව 1.1.ගාථා, වණ්නනාව.
    මනො ති කාමාවචර කුසලාදිභෙදං සබ්බම්පි චතුභූමික චිත්තං
18. ධම්මසංගනී පුග්ගල 1. චිත්තුප්පාද කාණ්ඩය, ද්වාදස අකුසලං
19. එම
20. එම, කාමාවචර කුසල කාණ්ඩය
    යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤ....සංඛාරා පස්සද්ධි.....අයං තස්මිං සමයෙ කායපස්සද්ධි තස්මිං සමයෙ විඤ්ඤණක්ඛන්ධස්ස පස්සද්ධි .....අයං තස්මිං සමයෙ, චිත්ත පස්සද්ධිහොති.
21. පටිසම්භිද.1.6. ඤණරාසිඡක්ක නිද්දේස.
    සොළසවත්‍ථුකං ආනාපානස්සතිසමාධිං භාවයතො සමාධිකානි ඉමානි ද්වේ ඤණ සතානි උප්පජ්ජන්ති.
22. ධම්ම පද අටුවාව1.1. ගාථාවණ්ණනා.
23. මජ්ඣිම නිකාය 3.4.10. ධාතු විභංග සුත්තං. ඡද්ධාතුරො අයංභික්ඛු පුරිසො.
24. සංයුත්ත නිකාය 2.1.7.7. නළකලාප සූත්‍රය.
25. මජ්ඣිම නිකාය 1.5.3. මහා වේදල්ල සුත්තං.
    යාචාවුසො වෙදනා යාච සඤ්ඤ යා ච විඤ්ඤණං ඉමෙ ධම්මා සංසට්ඨා නොවිසංසට්ඨා න ච ලබ්භා ඉමේසං ධම්මානං විනිබ්භුජ්ජිත්වා විනිබ්භුජ්ජිත්‍වා නානා කරණං පඤ්ඤපෙතුන්ති.
26. මජ්ඣිම නිකාය 3.4.10. ධාතුවිභංග සුත්තං.

චක්ඛුනා රූපං දිස්වා සෝමනස්සට්ඨානීයං රූපං උපවිචරති. දෙමනස්සට්ඨානීයං රූපං උපවිචරති, උපෙක්ඛාඨානීයං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා....මනසා ධම්මං විඤ්ඤාය...ඉති ඡ සොමනස්සුපවිචාරා ඡ දෙමනස්සුපවිචාරා ඡ උපෙක්ඛුපවිචාරා....

27. මජ්ඣිම නිකාය 1.2.8. මධුපිණ්ඩික සුත්තං.
චක්ඛුං ච ආවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සෝ ඵස්ස පච්චයා වේදනා යං වේදෙති තං සඤ්ජානාති යං සංජානාති තං විතක්කේති යං විතක්කේති තං පපඤ්චෙති යං පපඤ්චෙතිතතො නිදානං පුරිසං පපඤ්ච සඤ්ඤසංඛා සමුදචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසුචක්ඛු විඤ්ඤෙයොසු රූපෙසු.

28. අංගුත්තර නිකාය 1.2.6.1. සූත්‍රය.
පභස්සරමිදං භික්ඛවේ චිත්තං තංච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං.

29. එම, අට්ඨකථා.
චිත්තන්ති භවංග චිත්තං.... ආගන්තුකෙහීති අසහජාතෙහි පච්ඡ, ජවනක්ඛණෙ උප්පජ්ජනකෙහි. උපක්කිලෙසෙහීති රාගාදීහි උපක්කිලිට්ඨත්තා.

30. චන්දවිමල හිමි, රේරුකානේ, අභිධර්ම මාර්ගය, 2014, 122, 336, 345 පිටු.

31. එම, 336-337 පිටු.